## සාමාන්‍ය සමය අවසාන සතිය හෙවත් තිස්හතරවන සතිය

### සඳුදා

පළමුවන කියැවීම දානියෙල් 1: 1-6, 8-20

දානියෙල් දිවැස්ප්‍රසාදි තුමන්ගේ පොතෙන් ගත් පාඨයෙකි.

**"දානියෙල්ටත්, හානියාටත්, මිෂායෙල්ටත්, අසරියාටත් සමාන කළ හැකි අන් කිසිවෙක් නොවූහ."**

ජුදාහි රජ වූ ජෙහෝයාකිම්ගේ රාජ්‍ය කාලයෙහි තුන් වන අවුරුද්දේ දී බැබිලෝනියේ රජ වූ නෙබුකද්නෙසර් රජ ජෙරුසලම ආක්‍රමණය කොට එය වටලාගත්තේ ය. ස්වාමින් වහන්සේ ඔහුගේ අතට ජුදාවේ රජ වූ ජෙහෝයාකිම් පාවා දුන් සේක. ඔහු සමඟ දෙවියන් වහන්සේගේ මාලිගාවේ බඩු බාහිරාදිය සමහරෙක් ද පාවා දුන් සේක. නෙබුකද්නේසර් ඒ බඩු බාහිරාදිය ශිනාර් දේශයේ තමාගේ ම දෙවියන්ගේ දේවාලයට ගෙන ගොස් දේවාල භාණ්ඩාගාරයේ ඒවා තැන්පත් කළේ ය.

රජතුමා අශ්පෙනස් නම් තමාගේ ප්‍රදාන නපුංසකයා අමතා, ඉශ්රායෙල් සෙනඟ අතරෙන් රාජ වංශයට හා රදළ පෙළපතට අයත් තරුණයන් ස්වල්ප දෙනෙකු ගෙනෙන්නට ඔහුට නියම කළේ ය. ඔවුන් ශරීරාබාධ නැති, ශෝභා සම්පන්න, සිප් සතරෙහි සමත්, බොහෝ ඇසූ පිරූ තැන් ඇති, විචක්ෂණ, රාජ මාලිගාවේ සේවා කරන්නට සුදුසුකම් ඇති, අය විය යුතු යයි ද ඔවුන් ගෙනා පසු, කල්දිවරුන්ගේ භාෂාවත් සාහිත්‍යයත් ඔවුන්ට ඉගැන්විය යුතු යයි ද රජතුමා අශ්පෙනස්ට නියම කළේ ය. රජ තෙමේ තමා වළඳන භෝජනවලින් ද තමා පානය කරන මිදියුසින් ද කොටසක් දවස් පතා ඔවුන්ට දෙන්නටත් නියම කළේ ය. ඔවුන් තුන් අවුරුද්දක් පුහුණුව ලැබූ පසු රාජ සේවයට ඇතුළත් කළ යුතුව තිබිණි.

තෝරාගනු ලැබූ අය දානියෙල් ද හනනියා ද මිෂායෙල් ද අසරියා ද යන නම් ඇති ජුදා ජාතික තරුණයෝ වූහ.

දානියෙල් තෙමේ රජුගේ භෝජනයෙන් වත්, ඔහු බොන මිදියුසෙන් වත් තමා අපවිත්‍ර නොවී සිටින පිණිස අධිෂ්ඨාන කරගෙන, එසේ අපවිත්‍ර නොවී සිටින පිණිස අධිෂ්ඨාන කරගෙන, එසේ අපවිත්‍ර නොවී සිටීමට නපුංසකයන්ගේ අධිපතියාගෙන් අවසර අයැද සිටියේ ය. දෙවියන් වහන්සේ දානියෙල්ට කරුණාවත් අනුකම්පාවත් ලැබෙන්නට සැලැස්සූ සේක. ප්‍රධාන නපුංසකයා දානියෙල්ට මෙසේ කීය.

"ඔබේ කෑම ද බීම ද නියම කළ මාගේ ස්වාමින් වන රජ්ජුරුවන්ට මම බිය වෙමි. යම් හෙයකින් ඔබේ වයසේ තරුණයන්ට වඩා ඔබේ මුහුණ මැළවී ඇති බව එතුමාට පෙනී ගියොත්, මාගේ හිස ගසා දැමීමෙන් මා අනතුරට භාජනය විය හැකි ය."

එවිට දානියෙල් තමා ද හනනියා ද මිෂායෙල් ද අසරියා ද භාර ව සිටීමට පත් කළ භාරකාරයාට කතා කොට, "ඔබේ මෙහෙකරුවන් වන අපට කෑමට එළවළු ද බීමට වතුර ද දී දස දිනක් ඇතුළත දී කුමක් වන්නේ දැ යි සෝදිසි කර බලන්න. ඉන්පසු අපේ පෙනීම ද රජතුමාගේ භෝජන අනුභව කරන තරුණයන්ගේ පෙනීම ද සසඳා බලා ඔබට පෙනී යන හැටියට ඔබේ මෙහෙකරුවන්ට සුදුස්සක් කළ මැනව" යි කීය.

ඔහු ඒ යෝජනාවට එකඟ වී දස දිනක් තුළ ඔවුන් සෝදිසි කර බැලුවේ ය. දස දිනකට පසු ඒ සතර දෙනා රජතුමා නියම කළ භෝජන අනුභව කළ තරුණයන්ට වඩා හොඳ පෙනීමෙන් හා සතිප ශක්තියෙන් සිටින බව පෙනී ගියේ ය. එබැවින් භාරකාරයා ඉන්පසු ඔවුන්ට කන්නට නියම ව තිබූ ආහාර ද බොන්නට නියම ව තිබූ මිදියුස ද නතර කොට එළවළු පමණක් ඔවුන්ට දුන්නේ ය.

ඒ කරුණයන් සතර දෙනාට දෙවියන් වහන්සේ සාහිත්‍ය විෂයය හා ශිල්ප ශාස්ත්‍රය පිළිබඳ මනා දැනුමක් හා අවබෝධයක් දුන් සේක. සියලු ආකාර දර්ශන හා ස්වප්න තේරුම් කර දීමේ වරම ද දානියෙල් ට තිබිණි. තරුණයන් පුහුණු කිරීමට නියමව තිබූ කාලය හමාර වූ විට, ඔවුහු සියලු දෙන නෙබුකද්නෙසර් රජු ඉදිරියට ගෙනෙන ලද්දාහ. රජතුමා ඔවුන් සමඟ කතා කළේ ය. ඔවුන් සියලු දෙනා අතුරෙන් දානියෙල්ටත්, හනනියාටත්, මිෂායෙල්ටත්, අසරියාටත් සමාන කළ හැකි අන් කිසිවෙක් නොවූහ. එබැවින් ඔවුහු රාජ

සේවයට ඇතුළත් කරන ලදහ. තේරුම් පැහැදුම් ඇතිව විමසිය යුතු යම් යම් කාරණා සම්බන්ධයෙන් රජතුමා ඔවුන්ගෙන් විමසූ විට, මුළු රාජ්‍යයේ සිටි සියලු මන්ත්‍රකාරයන්ටත්, අනවිනකාරයන්ටත් වඩා දස ගුණයකින් ඔවුන් සමත් බව එතුමාට පෙනී ගියේ ය.

දේව වචනය මෙසේ ය.

පිළිතුරු ගීය — දානියෙල් 1: 29–34

**පිළිතුර : සමිඳුනි, සදහට ම ඔබ වහන්සේට පැසසුම් වේවා.**

ගීය :
සමිඳුනි, අපේ පියවරුන්ගේ දෙවිඳුනි, ඔබ වහන්සේට පැසසුම් වේවා!
ඔබ වහන්සේ වර්ණනා කරනු ලැබ සදහටම ඔබ උසස් කරනු ලැබේ වා!
ඔබ වහන්සේගේ මහිමාන්විත සුවිශුද්ධ නාමයට පැසසුම් වේවා!
එය වර්ණනා කරනු ලැබ සදහටම එය උසස් කරනු ලැබේවා!

ඔබ වහන්සේගේ තේජස් සම්පන්න දෙව්මැඳුර තුළ ඔබ හට පැසසුම් වේවා!
ඔබ වහන්සේ උසස් කරනු ලැබ,
සියල්ලට ඉහළින් සදහටම ඔබ මහිමාන්විත කරනු ලැබේවා!
ඔබ වහන්සේගේ රාජ්‍යයේ සිහසුන අරා සිටින ඔබ හට පැසසුම් වේවා!
ඔබ වහන්සේ වර්ණනා කරනු ලැබ,
සියල්ලට ඉහළින් සදහටම ඔබ උසස් කරනු ලැබේවා!

කෙරුබ්ම්වරුන්ට ඉහළින් වැඩසිටින
මහ සමුදුර මනින ඔබ වහන්සේට පැසසුම් වේවා!
ඔබ වහන්සේ වර්ණනා කරනු ලැබ,
සියල්ලට ඉහළින් සදහටම ඔබ වහන්සේ මහිමාන්විත වේවා!
අහස් කුසයෙහි සිටින ඔබ වහන්සේට පැසසුම් වේවා!
ඔබ වහන්සේ උසස් කරනු ලැබ සියල්ලට ඉහළින් සදහටම මහිමාන්විත වේවා!

සුපුවත් ජය නද — එළිදරව්ව 2: 10

ආලේලූයා! ආලේලූයා!
"මරණය දක්වා විශ්වාසී ව සිටින්න.
එවිට මම ඔබට ජීවන කිරුළ ප්‍රදානය කරමි" යි
සමිඳාණන් වහන්සේ වදාරන සේක.
ආලේලූයා!

නොහොත්

සුපුවත් ජය නද — මතෙව් 24: 42, 44

ආලේලූයා! ආලේලූයා!
අවදි ව සූදානම් ව සිටින්න.
මක්නිසාද, ඔබ බලාපොරොත්තු නොවන පැයක දී
මනුෂ්‍ය–පුත්‍රයාණෝ වඩින සේක.
ආලේලූයා!

සුවිශේෂය ලූක් 21: 1–4

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

**“මේ දිළිඳු වැන්දඹුව අනෙක් හැමට ම වඩා පඬුරු දැම්මා ය.”**

ජේසුස් වහන්සේ අවට බැලූ විට ධනවතුන් සිය පුද පඬුරු දේව මාළිගයෙහි ගබඩාවෙහි දමනු දුටු සේක. එක් දිළිඳු වැන්දඹු ස්ත්‍රියක් තඹ සල්ලි දෙකක් ද දමනු උන් වහන්සේ දැක, “ඇත්තෙන් ම මම ඔබට කියමි. මේ දිළිඳු වැන්දඹුව අනෙක් හැමට ම වඩා පඬුරු දැම්මා ය. මන්ද, ඔවුන් සියල්ලෝ ම තමන්ට තිබුණ වැඩිපුර දෙයින් ගබඩාවට පඬුරු දැමූහ. එහෙත් මැ දුප්පත් ව සිටියදීත් තම දිවි පෙවෙන සඳහා වූ මුළු වත්කම ම පිදුවා ය” යි වදාළ සේක.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.